www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බැරැක් ඔබාමාගේ මුහුනු දෙක

## The two faces of Barack Obama

**බිල් වැන් ඕකන් විසිනි**
**2008 පෙබරවාරි 14**

අඟහරුවාදා මේරිලැන්ඩ්, වර්ජිනියා සහ වොෂින්ටන් ඩී.සී. හි පැවැත්වූ "පොටෝමැක් ප්‍රාථමික මැතිවරන" වලින් ජයගත් ඉලිනොයි සෙනෙට් සභික හා ඩිමොක්‍රටික් පක්ෂ ජනාධිපති ධූරාපේක්ෂක බැරැක් ඔබාමා, එදින රාත්‍රියේ විස්කොන්සින් සරසවියේ පිරී ඉතිරී ගිය ශ්‍රවනාගාරයක පෙනී සිටිමින් පැවැත්වූ කතාව, ඉරාක යුද්ධය සම්බන්ධයෙන් පමනක් නොව ඇමරිකාවේ ම සමාජ කොන්දේසි පිලිබඳ එහි අඩංගු වූ ජනතාවාදී පූච්චානම් හේතුවෙන් අවධානයට ලක්වීමට සුදුසු ය.

විස්කොන්සින් රැලිය, අඟහරුවාදා ප්‍රාථමික මැතිවරනවල මුවවිට දී මේරිලැන්ඩ් සරසවියේ 20,000 ක් හා වර්ජිනියා බීච් හි 17,000 ක් වසයෙන් බොහෝ කොට තරුන ජනකායන් ඇතුලත්ව විශාල පිරිසක් ඇදගත්තා වූ ද ඔබාමා වඩා "වාම" මුහුනකින් පෙනී සිටීම දැක ගත්තා වූ ද උද්ඝෝෂන මාලාවකින් අලුත් ම එකයි.

උද්ඝෝෂකයකුගේ සහජාසයන් සතුව සිටින ඉලිනොයි සෙනෙට් සභිකයා ජනකායන්ට අවශ්‍ය යයි ඔහුට හැඟෙන දේ දීමට මං පෙත් සොයයි. විස්කොන්සින් හි දී එක්සෝන් වෙත "වාර්තාගත ලාභ" ලැබීම ඉහල යන "පොම්පයෙන් එන මිල" සමග ඔහු සම්බන්ධ කලේ උද්යෝගී අත්පොලසන් නාදයක් අවුලුවාලමිනි. "රැකියා පිටරට පටවන්නා වූ ද අවම වැටුප සඳහා තම නව යොවුන් දරුවන් සමග වෝල් මාට් හි තරඟ වැදීමට දෙමාපියන්ට බල කරන්නා වූ ද" වෙලඳ ගිවිසුම් පිලිබඳව ඔහු කතා කලේ ය. තමන් "හුදෙක් වෝල් වීදියට පමනක් නොව මහා වීදියටත් (මහ පාරටත් - පරිවර්තක) ඇහුම් කන් දෙන සැපේ දී පමනක් නොව දුකේ දී ද කම්කරුවන් සමග සිටින ජනාධිපති වරයෙක්" වන බවට ඔහු පොරොන්දු විය.

ඉරාක ගැටලුව ගැන සඳහන් කරමින් "මොන ම අයුරකින්වත් බලාත්මක නො කල යුතුව තිබූ හා ක්‍රියාවේ නො දැමිය යුතුව තිබූ යුද්ධයක, එක් මෙහෙවරකට පසු තව එකක රාජකාරි සඳහා අපගේ භටකායන් යවනු ලැබෙති" යයි කියා සිටි ඔහු "ඡන්ද ගරා ගැනීම සඳහා සැප්තැම්බර් 11 සිද්ධි යොදා ගන්නවුන්ව" සමච්චලයට ලක් කලේ ය.

"හිමිදිරියට පෙර වැඩට ගොස් පසුව තමන්ගේ බිල්පත් ගෙවන්නේ කෙසේදැයි කල්පනා කරමින් නිදිවර්ජිතව රාත්‍රිය ගත කරන පියෙක්," "දහවල සම්පූර්නයෙන් විදුහලේ ගත කොට ඉන් පසු රාත්‍රී වැඩ මුරය ද වැඩ කලත් රෝගීව සිටින තම සොහොවුරියගේ බෙහෙත් බිල ගෙවා ගත නො හැකි යයි ඔහුට කිවූ කාන්තාවක්," "තම සම්පූර්න දිවිය ම කැපකොට සේවය කල සමාගම බංකොලොත් වීම නිසා විශ්‍රාම වැටුප අහිමි වූ විශ්‍රාමිකයෙක්," හා "දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට විද්‍යාල වේලාවෙන් පසු ඩන්කින් ඩෝනට්වල වැඩ කරන ගුරුවරියක්," ආදී වසයෙන් සාමාන්‍ය ඇමරිකානුවන් මුහුන දෙන පිරිහෙමින් පවතින සමාජ කොන්දේසි පිලිබඳව සඳහන් කරමින් ඔහු තම කතාව ඉදිරියට කරගෙන ගියේ ය.

ඉහත ගැටලුවලට ඔහු ප්‍රතිචාර දැක්වූයේ කම්කරුවන්ට බදු සහන, සෞඛ්‍ය ප්‍රතිසංස්කරන, හොඳ වැටුප් හා " ප්‍රධාන විධායක නිලධාරීන්ගේ බෝනස් දීමනා නොව විශ්‍රාම වැටුප් ආරක්ෂා කරන" ආන්ඩුවක් පිලිබඳ පොරොන්දු දෙමිනි.

"අපගේ සිහින සැබෑවීම ප්‍රමාද නො වනු ඇත, අපගේ අනාගතය ප්‍රතික්ෂේප නො වනු ඇත, පැමින තිබෙන්නේ වෙනසක් සඳහා කාලය යි" යනුවෙන් ප්‍රතිඥාවක් සමගින් ඔහු සිය කතාව සමාප්ත කලේ මාටින් ලූතර් කිංගේ පූච්චානම් ප්‍රතිරාවය කරමිනි.

ඩිමොක්‍රටික් පක්ෂ සංස්ථාපිතයටත් එය නියෝජනය කරන මහ ව්‍යාපාරිකයේ අවශ්‍යතාවලටත් මඳක් නැවතී සිතා බැලීමට ඉඩ සලසන්නා වූ අංශයක් මෙම කතා තුල අඩංගු වන බව පෙනෙන්නට තිබේ. ඔබාමාගේ වාචාල සීඝ්‍රතාව භයානක අඩවියකට ධාවනය වන බව දැක ගත හැකි වනු ඇත. අවසාන විග්‍රහයේ දී විදේශයන්හි යුද්ධය ද රට තුල සමාජ ප්‍රතිගාමීත්වය ද යන බුෂ් පරිපාලනයේ ප්‍රතිපත්තිවල අත්‍යවශ්‍ය සහකරුවෙක් ලෙස ඩිමොක්‍රටික් පක්ෂය සිය සේවය ලබා දී ඇත.

එහෙත් මූලික වටයේ මෙම ජනතාවාදී පූච්චානම් වනාහි ඔබාමාගේ එක් මුහුනතක් පමනි. ඔහු ප්‍රසිද්ධියේ විවේචනය කරන, ඔහුගේ මැතිවරන උද්ඝෝෂනයට දස මිලියන ගනනින් මුදල් පොම්ප කොට ඇති සංගතවල අවශ්‍යතා දෙසට ස්ථිර ලෙස යොමු වූ තවත් මුහුනක් ඔහුට තිබේ.

පොටෝමැක් ප්‍රාථමික මැතිවරනවලට පසු දින බිස්නස් වීක් සඟරාව "ඔබාමා ව්‍යාපාරවලට හොඳ ද?" යන හිසින් විශේෂ වාර්තාවක් පල කලේ ය. වාර්තාව එම ගැටලුවට ඍජු පිලිතුරක් නො දුන් අතර ඉලිනොයි සෙනෙට් සභිකයා "වෙනසක්" සඳහා ප්‍රසිද්ධියේ ආයාචනා කරන අතරවාරයේ ම වෝල් වීදිය සහ සංගත ප්‍රභූව සමග පවත්වන පුද්ගලික සාකච්ඡා මත බොහෝ දුරට පදනම් වෙමින් ව්‍යාපාරික සඟරාව ගන්නා බව පෙනෙන්නට තිබුනු ආකල්පය වූයේ වරලත් "ඔව්" යන පිලිතුර යි.

පසුගිය ඉරිදා බිස්නස් වීක් වාර්තා කලේ ඩිමොක්‍රටික් වරන මන්ඩලවල ජයග්‍රහනයෙන් පසු, ඔබාමා තම " මහජන ව්‍යාපාරය" යනුවෙන් හඳුන්වන දෙයට මුදල් පොම්ප කිරීම සඳහා සහචර ප්‍රකෝටිපතියන්ගෙන් මිලියන ගනනින් ආධාර රැස් කරගැනීමට කටයුතු කල හා ඔහුගේ වෝල් වීදියේ "මිටි බඳින්නන්" ගෙන් එක් අයෙක් වන, යූබීඑස් ඇමරිකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී රොබට් වුල්ෆ් සමග ඊමේල් හුවමාරු කර ගැනීමට ඔබාමා සිය පරිගනකය ඉදිරියේ වාඩි වූ බවයි. සෙන්ටර් ෆෝ රෙස්පොන්සිව් පොලිටික්ස් ආයතනය මගින් කර ඇති තක්සේරු කිරීම්වලට අනුව පසුගිය වසරේ ඔබාමාගේ මැතිවරන උද්ඝෝෂනයට එක් රැස් කර ගන්නා ලද මුදල්වලින් සියයට 80ක් පමන ව්‍යාපාරවලට අනුබද්ධිත ප්‍රදානය කිරීම්වලින් ගලා ආවේ වෝල් වීදිය ඉදිරියෙන් ම සිටිමිනි. රැස් කර ගත් මුදල්වලින් අඩකටත් වැඩියෙන් ගලා ආවේ ඩොලර් 2,300ක් හෝ ඊට වැඩි ආධාර වසයෙනි.

වුල්ෆ්ට අමතරව ඩොලර් බිලියන 52කුත් ගනනක ශුද්ධ ධනයකට හිමිකම් කියන ඇමරිකාවේ දෙවන විශාලතම ධනවතාවන වොරන් බුෆේ සමග ද ඔබාමා නිරන්තර ආශ්‍රය පවත්වා ගෙන යයි. ඔබාමාගේ මුල් පෙලේ ආර්ථික උපදේශකයන්ගෙන් එක් අයෙක් වන්නේ චිකාගෝ සරසවියේ මහාචාර්ය වරයෙක් හා ප්‍රමුඛ පෙලේ නිදහස් වෙලඳපොල ප්‍රතිපත්ති අද්වකාත් වරයෙක් වන ඔස්ටන් ගුල්ස්බී ය.

## වෝල්කර්ගේ වරපත්‍රය

වඩා අර්ථභාරී වන්නේ 1979 දී ඩිමොක්‍රටික් ජනාධිපති ජිමී කාටර් විසින් ෆෙඩරල් රිසර්ව් මන්ඩලයේ සභාපති ලෙස පත් කරන ලද්දා වූ ද රොනල්ඩ් රීගන්ගේ දක්ශිනාංශක රිපබ්ලිකන් පරිපාලනය යටතේ වසර හතක් පුරා එක්සත් ජනපද මහ බැංකුවේ අධිපතියා වසයෙන් කටයුතු කලා වූ ද පෝල් වොල්කර් පසුගිය මාසයේ දී ඔබාමාගේ අපේක්ෂකත්වයට අනුමැතිය පල කිරීම යි.

උද්ධමනයට එරෙහි අරගලයේ නාමයෙන් මූල්‍ය ප්‍රාග්ධනයේ ආධිපත්‍යධාරී කොටස්වල බලපෑම මත ඉහල පොලී අනුපාතික රෙජිමයක් ආරම්භ කිරීමේ වගකීම දරන්නේ වොල්කර් ය. ඔහුගේ මූල්‍ය ප්‍රතිපත්තිය, ගුවන් පථ පරිපාලකයින් නෙරපා හැරීම සහ පැට්කෝ වැඩ වර්ජනය තලා දැමීමෙන් ඇරඹි මූලික කර්මාන්ත විශාල ප්‍රමානයක් වසා දැමීමත් 1930 ගනන්වල මහා අවපාතයෙන් පසු දරුනු ම ආර්ථික අවපාතය මුදාහැරීමත් සමගින් අත්‍යන්තයෙන් බැඳී පවතී. මෙම ප්‍රතිපත්තිවල අවසන් ප්‍රතිඵලය වූයේ අද දක්වා ම දිග් ගැසෙමින් එන ක්‍රියාදාමයක් වන වැඩ කරන මහා ජනකායන්ගේ සිට තුනී මූල්‍ය ප්‍රභූ ස්ථරයක් වෙත යෝධ ලෙසින් ධනය ගලා යාම යි.

ඔබාමාට තමන් දක්වන පිටුබලය නිවේදනය කරමින් නිකුත් කල ප්‍රකාශයක වොල්කර් සඳහන් කලේ මීට පෙර තමන් පාක්ෂික දේශපාලනයේ නිරත වීමෙන් වැලකුනු බවයි. තමන් මැදිහත් වීමට තීන්දු කලේ " වත්මන් වෙලඳපොල කලබගෑනිය හේතුවෙන්" නො වන බවත් ඒ වෙනුවට "වර්තමානයේ දී අපගේ ජාතිය ජාතිකවත් ජාත්‍යන්තරවත් මුහුන දී සිටින අභියෝගයන්ගේ පෘථුලත්වය සහ ගාම්භීරත්වය" නිසා බවත් ඔහු කියා සිටියේ ය. "එම අභියෝග නව නායකත්වයක් සහ නැවුම් ප්‍රවිෂ්ටයක් ඉල්ලා සිටී" යයි ඔහු එයට එකතු කලේ ය. ඔබාමාගේ නායකත්වය " ලෝකය පුරා අපගේ දැක්මට, අපගේ ශක්තියට සහ අපගේ අභිලාෂයන්ට අවශ්‍ය විශ්වසනීයත්වය පුනස්ථාපනය කිරීමට" සමත් වනු ඇතැයි සමාප්තියේ දී ඔහු සටහන් කලේ ය.

දක්ශිනාංශක පන්ඩිතයෙක් හා රීගන් පරිපාලනයේ හිටපු ආර්ථික උපදේශකයෙක් වන ලැරී කුඩ්ලෝ, තමන් වරෙක වොල්කර්ගේ කථා රචකයෙක් ලෙස කටයුතු කර තිබුනු බව සටහන් කරමින් ද ඔහු වනාහි "අදායම් හා මූල්‍ය ප්‍රතිපත්ති පිලිබඳ අවංකත්වයේ මූර්තියක් හා සම්භාව්‍ය කොන්සර්වේටිව්වාදියෙක් වන ශ්‍රේෂ්ට ඇමරිකානුවෙක්" යනුවෙන් විග්‍රහ කරමින් මේ මස මුල දී ඔහුගේ අනුමැතිය පිලිබඳව අදහස් පල කලේ ය.

වොල්කර් "මෙම අනුමැතිය ආවාට ගියාට පල කර තිබෙනවා නො වේ. මාව විශ්වාස කරන්න. ඔහු කිසි කලෙක මෙවැනි දේශපාලනික තීරනවලට යොමු වන අයෙක් නො වේ," යයි කුඩ්ලෝ ලිවීය. "වොල්කර් වනාහි නව (ක්ලින්ටන් පරිපාලනයේ ආර්ථික ප්‍රතිපත්තිය මෙහෙයැවූ වෝල් වීදියේ බලවතා වන) රොබට් රූබින් ද? වොල්කර් මහතා යම් ආකාරයකින් ඔබාමාට උපදෙස් දෙනවා වන්නට බැරි ද? මූල්‍ය කටයුතුවල දී ඔබාමා මුලින් විශ්වාසය තැබුවාට වඩා ගතානුගතික වන්නට බැරි ද?" යනුවෙන් අසමින් කුඩ්ලෝ සිය අදහස් දැක්වීම සමාප්ත කලේ ය.

මැතිවරන වේදිකාවේ සිට ඔබාමා වාම වාක්‍යාංශ දොඩවන අතරතුර තිරයෙන් පිටුපස ඇතිවෙමින් තිබෙන සැබෑ සබඳතා මේවා ය. වොල්කර් වැන්නවුන් ඉලිනොයි සෙනෙට් සභිකයා දැක ගන්නේ වැඩ කරන මහ ජනයාගේ ජීවන කොන්දේසි වැඩි දියුනු කිරීම

නොව ඇමරිකානු මූල්‍ය ප්‍රාග්ධනයේ ගෝලීය අවශ්‍යතා සුරක්ෂිත කරගැනීම සඳහා ප්‍රධාන වෙනස්කම් ඇති කිරීමට යොදා ගත හැකි ප්‍රයෝජනවත් වාහකයක් ලෙසිනි.

නො නවතින ආර්ථික අර්බුදය හා වැඩෙන සමාජ ආතතීන් මගින් ඉස්මත්තට ගෙනෙනු ලබන අන්තරායන්ට මුහුන දීම සඳහා ඇමරිකාවේ ප්‍රථම අප්‍රිකානු-ඇමරිකානු ජනාධිපතිවරයා වනු ඇත්තා වූ ඔබාමා වඩාත් සුදුසු තැනැත්තා ලෙස ඔවුන් විශ්වාස කරනු ඇති ය යන්න නිසැක ය. ජාතික සමගියේ හා " වෙනසේ" නාමයෙන් කම්කරුවන්ගෙන් වඩ වඩා කැපකිරීම් ඉල්ලා සිටීමට මීට වඩා සුදුසු කවුරුන් ද? ඒ අතර ම බුෂ් පරිපාලනයේ උරුමයන් වන විදේශ ප්‍රතිපත්ති අන්තරායන් සහ වැඩෙන ගෝලීය හුදකලාවෙන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය බේරා ගැනීමට උපකාරී වන නැවුම් මුහුනකින් ද ලෝකය ඉදිරියේ ඔහු සැරසී සිටිනු ඇත.

මහ ව්‍යාපාරිකය සමග පවතින මෙම සබඳතාවල තතු යටතේ දරිද්‍රතාවට හා සමාජ අසමානතාවට මුහුන දීම පිළිබඳ ඔබාමාගේ උද්ඝෝෂන පූර්වචානම් සත්‍ය වසයෙන් ම විශ්මය ජනක වන මට්ටමක නරුමත්වයක් හා වාචාලත්වයක් ගැබ් කර ගනී. වෙනසක් පිළිබඳ ඔහුගේ තෙරක් නැති පොරොන්දු යෝධ සංගතවල හා වෝල් වීදියේ ලාභ අවශ්‍යතාවලට අතිමූලික වසයෙන් අභියෝග කරන කිසිඳු රැඩිකල් ආර්ථික වැඩ පිළිවෙලකට මොන ම සම්බන්ධයක්වත් නැත.

ඒ වෙනුවට ඔබාමා ඉදිරිපත් කොට ඇත්තේ "ඔහොම යං" ප්‍රවිෂ්ටයක් හා නය හා හිඟ අඩු කිරීමේ අවශ්‍යතාව අවධාරනය කරන කොන්සර්වේටිව් (ගතානුගතික) අදායම් ප්‍රතිපත්තියකි. බුෂ් පරිපාලනයෙන් උරුම කරගත් ඩොලර් බිලියන 400කට ආසන්න වාර්තාගත හිඟයක් සමගින් ඔහුට තනතුර භාරගැනීමට සිදු වන තතු තුල මෙමගින් මේ වන විටත් තීර්නය කෙරී ඇත්තේ කප්පාදු පියවර සහිත න්‍යාය පත්‍රයකි.

බදාදා විස්කොන්සින් හි ජේන්ස්විල්වල ජෙනරල් මෝටර්ස් වැඩ බිමක් වෙත සංචාරය කල ඔබාමා වසර 10ක් පුරා ක්‍රියාත්මක වනු ඇත්තා වූ යටිතල පහසුකම් හා විකල්ප බලශක්ති වැඩ සටහන් වෙත කෙරෙන ආයෝජන අඩංගු ඊනියා රැකියා වැඩ පිළිවෙලක් ඉදිරියට දැමීය. ඇමරිකානු ධනවාදය මුහුන දී සිටින ගැඹුරු අර්බුදයේ තතු තුල මෙය අංශුමාත්‍රයකටත් වඩා අඩු අතර හිඟයන් අඩු කිරීම සඳහා කෙරෙන බලපෑම් යටතේ මෙම අංශුමාත්‍රය ද වහ වහා වාෂ්ප වී යනු ඇත.

ධනවාදය පිළිබඳ කතා කිරීමට අනවශ්‍ය අය දරිද්‍රතාවය සහ විරැකියාව ගැන සැලකීමේ දී ස්ව-කැමැත්තනේ ම දත කට පූට්ටු කරගෙන සිටිය යුතු ය. ඒ මන්ද යත් එම අංශ ගැන ගැඹුරින් කතා කිරීම සමාජ නිශ්පාදන බලවේගයන්තේ පුද්ගලික අයිතිය ත් එමගින් නිර්මිත යෝධ සමාජ අසමානතාව ත් නො තකා කල නො හැක්කක් බැවිනි. මිලියන සිය ගනනක ඇමරිකානුවන්හට සුරක්ෂිත රැකියා සහ ජීවන තත්වයන් ද ශිෂ්ට සම්පන්න නිවාස, සෞඛ්‍යාරක්ෂනය සහ අධ්‍යාපනය ලැබීමේ අයිතිය ද සාක්ෂාත් කර ගත හැක්කේ සුපිරි කෝටිපතියන් අත ඇති ධනය කම්කරු පන්තියේ පුලුල් මහ ජනයා වෙතට දුර දිග යන පරිදි යලි බෙදා හැරීමේ වැඩ පිළිවෙලක් හරහා පමනි.

වුල්ෆ්, බූෆේ හා වොල්කර් වැන්නවුන් ඔබාමාට පිටුබලය දෙන්නේ එවන් පිලිවෙතක් අහලකටවත් යමේ අදහසක් ඔහුට කිසි ලෙසකින්වත් නොමැති බව ඔවුන් දන්නා නිසා යයි පැහැදිලිව ම කිව හැක.

යුද්ධය පිළිබඳ ගැටලුව ගැන සැලකීමේ දී, ඇමරිකානු මිලිටරිවාදය අවසන් කිරීමේ මාධ්‍යයක් ලෙස ඔබාමාගේ උද්ඝෝෂනය දැක ගන්නා අය මුලුමනින් ම අපේක්ෂා භංගත්වයට පත්වනු ඇත. ඉලිනොයි සෙනෙට් සභිකයා ප්‍රතිඥා දී ඇත්තේ වාර්ෂිකව ඩොලර් බිලියන 700ක් ගිල ගන්නේ යයි ගනන් බලා ඇති ඉහල නගින එක්සත් ජනපද මිලිටරි වියදම අඩු කිරීමට නොව තවත් ඉහල දැමීමට යි. යුද හමුදාවට තවත් සොල්දාදුවන් 65,000ක් ද නාවික භටයින් 27,000ක් ද අලුතින් බඳවා ගැනීමට ඔහු කැඳවුම් කර ඇත. මැද පෙරදිග සහ මධ්‍යම ආසියවේ තෙල්වලින් ආඪ්‍ය කලාපයන් මත එක්සත් ජනපද ආධිපත්‍යය තහවුරු කර ගැනීමේ එල්ලය ඇතිව කෙරෙන මිලිටරි ආක්‍රමනය වහංගු කරගැනීම සඳහා කඩතුරාව ලෙස බුෂ් පරිපාලනය විසින් සොයාගත් " ත්‍රස්තයට එරෙහි යුද්ධය"ට "භූමියේ වැඩිපුර භටයන්" යොදන බවට ඔහු ප්‍රතිඥා දී ඇත.

ඉරාකය ම ත් සැලකිල්ලට ගැනීමේ දී, එක්සත් ජනපද සොල්දාදුවන් හා නාවික භටයන් දස දහස් ගනනක් තව දුරටත් එහි වාඩිලාගෙන සිටීමත් එමගින් එහි ජනයා මර්ධනය කිරීමත් ඉදිරි වසර ගනනාව පුරා දැක ගැනීමට තුඩු දෙන සූත්‍රයක් වන "එක්සත් ජනපද අවශ්‍යතා" ආරක්ෂා කිරීමට හා "ත්‍රස්තවාදයට එරෙහි මෙහෙයුම්" කරගෙන යාමට ඔහු දෙන ප්‍රතිඥාව මගින් යුද්ධය අවසන් කරන බවට ඔහු දෙන පොරොන්දු නිෂ්ප්‍රභ වේ.

ඔබාමාගේ පූර්වචානම් මගින් මහජන අපේක්ෂාවන් දැල්වෙන තරමට ම- එවැන්නක් සිදු වන බවට ඇඟවුම් පවතී- ඒවා අනිවාර්යයෙන් ම සුනු විසුනු වී යාමට නියමිතය. ප්‍රාථමික මැතිවරන වටය අවසන් වූ වහා ම රිපබ්ලිකානු දක්ෂිනාංශයෙන් මෙන් ම ඩිමොක්‍රටික් පක්ෂයේ ම කොටස්වලින් තමන්ගේ වැඩ පිලිවෙල පැහැදිලි කරන ලෙස ඔබාමාට බල කෙරෙන තතු යටතේ මෙය සිදු වීමට ඉඩ ඇත. නොවැම්බරයේ දී ඔහු ධවල මන්දිරය අල්ලා ගතහොත් ඔහු නායකත්වය

දෙනු ඇත්තේ ඇමරිකාව තුල ත් ඉන් පිටත ත් ඇමරිකානු කතිපයාධිකාරයේ අවශ්‍යතා ආරක්ෂා කිරීමට කැපවුනු පරිපාලනයකට යි.

එක්සත් ජනපදය තුල ප්‍රගතිශීලි සමාජ පරිවර්තනයක් ඇති කිරීමේ ත් අන් රටවල් තුල එක්සත් ජනපද මිලිටරිවාදය අවසානයකට ගෙන ඒමේ ත් මාධ්‍යයක් ලෙස ඔබාමාගේ උද්ඝෝෂනය දෙසට හැරෙන්නවුන් දැක ගනු ඇත්තේ ඩිමොක්‍රටික් පක්ෂයත් එය නියෝජනය කරන සංගත සහ මූල්‍ය අවශ්‍යතා ත් ඒ කිසිවකට ඉඩ නො දෙන බව යි.

මෙම අත්‍යවශ්‍ය අරමුනු සාක්ෂාත් කර ගත හැක්කේ ඩිමොක්‍රටික් පක්ෂයෙන් සහ සමස්ත ද්වි-පක්ෂ පද්ධතියෙන් තීරනාත්මක බිඳී වෙන් වීමකින් ද මහජන සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගීම හරහා කම්කරු පන්තිය ස්වාධිනව බලමුලු ගැන්වීම මගින් ද පමනි.

© www.wsws.org